# බෞද්ධාලෝකය

ඊ-පුවත්පත

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය

ශ්‍රී බුද්ධ වර්ෂ 2565 වූ
මැදින් මස 17 වන බ්‍රහස්පතින්දා



පොළොන්නරුව අවුකන බුදු පිළිම වහන්සේ

## බුදු දහමින් පෝෂිත ශ්‍රී ලාංකීය සංස්කෘතිය

එකම ජාතියක් විසින්, ශත වර්ෂ 22 ක් පමණ දීර්ඝ කාලයක් තුළ එකම සංස්කෘතියක් සුරැකීම ඓතිහාසික වශයෙන් අගය කළ යුත්තකි. ලෝකයේ බොහෝ ජාතීන්ට කළ නොහැකි වූ කාර්ය භාරයන්, බුදු දහමින් පෝෂිත ශ්‍රී ලාංකේය සංස්කෘතිය තුළ ආරක්ෂා වී පැවතෙයි.

එය ආරක්ෂා කළ යුත්තේ ඇයි? ලාංකේය සංස්කෘතිය පෝෂණය වී ඇත්තේ බුදු දහමේ මූලික ඉගැන්වීම්වලට අනුකූලවය. එය සංකේතවත් කෙරෙන්නේ වැවයි දාගැබයි ගමයි පන්සලයි යනුවෙනි.වැවෙන් ආර්ථික දියුණුවත්, දැගැබෙන් ආධ්‍යාත්මික සංවර්ධනයත් අර්ථවත් කෙරේ. බුදු දහම මඟින් සංවර්ධනය යනුවෙන් අර්ථවත් කෙරෙන්නේ ආර්ථික සංවර්ධනය සමඟම ආධ්‍යාත්මික ගුණ වගාවත් සමතුලිත විය යුතු බවයි. එය ද්වි චක්ඛු හෙවත් ඇස් දෙකෙන්ම බලා කටයුතු කිරීමට මාර්ගෝපදේශයකි. එවැනි ජීවන දර්ශනයක් ඇති ලාංකිකයන්ගේ දිවි පැවැත්ම සකස් වී ඇත්තේ පංච නියාමන ධර්ම වලට අනුකූලවය. බීජ නියාමය, උතු නියාමය, චිත්ත නියාමය, ධම්ම නියාමය, කම්ම නියාමය අනුව ඔවුහු තමාගේ අභිවෘද්ධිය මෙන්ම අන්‍යයන්ගේ දියුණුවත් අපේක්ෂා කරති කිසිවෙකුටත් හිංසාවක් නොකරති. එවැනි මිනිසුන් සිටින සමාජයක ජනතාව සතුටින් ජීවත් වන්නෝ වෙති. ධන කාමයෙන් හෝ බල කාමයෙන් හෝ උමතු වූවෝ නොවෙති.

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය මඟින් මාසිකව සෑම පුර පසළොස්වක පොහෝ දිනකම පලකරනු ලබන බෞද්ධාලෝකය ඊ-පුවත්පත සඳහා නිර්මාණ ඉදිරිපත් කිරීමේ අවස්ථාව ඇත.නිර්මාණ ඉදිරිපත් කිරීමට කැමැත්තේ නම්, එම නිර්මාණ අපගේ පහත සඳහන් ලිපිනයට ලියා එවීම හෝ විද්‍යුත් ලිපිනය ඔස්සේ එවීමට කටයුතු කළ හැක.(පිටු දෙකක ප්‍රමාණයට සෑහෙන තරම් ලිපි) සෑම කලාපයක්ම www.acbc.lk අප වෙබ් අඩවියෙන් නිකුත් කරන අතර මීට පෙර නිකුත් කරන ලද මාසික ඊ-පුවත්පත් අප වෙබ් අඩවියෙන් පරිශීලනය කළ හැකිය.


බෞද්ධාලෝකය ඊ-පුවත්පත

**උපදේශක මණ්ඩලය**
මහාචාර්ය නිමල් ද සිල්වා
මහාචාර්ය මාලිනී ඇඳගම
මහාචාර්ය සුසිරිපාල මාලිම්බඩ

**සංස්කරණ කළමණාකරනය**
ඉෂාන් බුද්ධික එදිරිසූරිය


**සංස්කාරක මණ්ඩලය**
නාලක ජයසේන
ශ්‍යාම් නුවන් ගනේවත්ත

**පිටු සැකැස්ම**
කාවින්ද දිල්ෂාන්
ක්‍රිෂාන්ති දිසානායක

**ප්‍රකාශනය**
බෞද්ධ තොරතුරු මධ්‍යස්ථානය
සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය



**සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය**
අංක 380. බෞද්ධාලෝක මාවත. කොළඹ 07.
දුරකථනය (011 266 5047/071 864 5554)
ෆැක්ස් (011 266 5047)
Web: www.acbc.lk
E-mail: buddhistinfo380@gmail.com

# Lesson on Proper Practice

Medin full-moon day is remembered by Buddhists as the day the Buddha commenced his journey to Kapilavattu, the capital of the Sakya Kingdom, on the invitation of King Suddhodana. This was the Buddha's first visit to his homeland after his renunciation on the day Prince Rahula was born. The latter now was seven years old. The distance was 60 yojanas, nearly 900 kilometers and the Buddha reached his destination on the Wesak full-moon day, covering a distance of around 14-15 kilometers a day by foot. Interestingly, today people find it difficult to walk even from one bus halt to another and jogging tracks are opened to keep the people fit by jogging!!

The city of Kapilavattu was bedecked with colourful streamers and there was merriment all round. All were waiting with eagerness to get a glimpse of that wonderful person, their own Prince and heir to the throne, who left all royal pleasures, his adoring wife and the new-born child in search of a way out of perpetual sickness, ageing and death that was inflicting everyone without any distinction. It was a quest that culminated in discovering and comprehending the four noble truths with his own effort, thereby becoming a *Sammāsambuddha,* a Supremely Enlightened One. His lineage was not of the Sakyas but of the Buddhas, past and present.

King Suddhodana and his retinue had made all arrangements for the Buddha and the 20,000 accompanying bhikkhus to stay at Nigrodharama and after seeing to all their needs left for the night. Because there was no invitation by anyone for the morning meal, the Buddha with his accompanying bhikkhus went on the morning alms-round. Princess Yasodhara saw the Buddha on alms-round from the palace window and immediately rushed to inform King Suddhodana.

Princess Yasodhara saw the Buddha on alms-round from the palace window and immediately rushed to inform King Suddhodana. He, in turn, hastily went to the Buddha and asked the Buddha as to why he was shaming his father and the entire Sakyan clan by begging for food from door to door in this manner. Whereupon, the Buddha replied that it was the practice of all the Buddhas to go round for alms-food from house to house, and therefore it was right and proper for him to keep up the tradition. The following two verses were then uttered by the Buddha

***Uttiṭṭhe nappamajjeyya – dhamme sucaritaṃ care***
***Dhammacārī sukhaṃ seti - asmiṃ loke paramhi ca***

***Dhammaṃ care sucaritaṃ - na naṃ duccaritaṃ care***
***Dhammacārī sukhaṃ seti - asmiṃ loke paramhi ca***

**"Do not neglect observing proper practice; observe proper practice' One who observes proper practice lives happily both in this world and in the next."**

**"Observe proper practice; do not observe improper practice. One who observes proper practice lives happily both in this world and in the next."**


It may be observed that what King Suddhodana expected was for the Buddha to come to the palace for the morning meal, which he thought was proper because he was the latter's father and going on alms-round was a slur to his position as king; but the Buddha thought otherwise. The Buddha could have broken tradition to please his father.

The Buddha, instead, observed proper practice by going on alms-round as there was no invitation.

For anyone holding position, be he the head of state, a minister, a head of a department, company, institution, school or even the head of a family, one has to observe proper practices incumbent on that position. Then there is happiness and prosperity. If on the other hand, observing proper practice is neglected due to family and other connections and improper practices are observed, there will be unhappiness in a country, institution or family.

On this Medin full-moon day reflect on these words of the Buddha and correct the course of action where proper practices are neglected and improper practices are being observed.

B.C2565



*by*
Siri Vajirārāmaye Ňāṇasīha

## මැදින් පොහොයේ වැදගත්කම

බුදුරජාණන් වහන්සේ සිය නෑදෑ හිතමිතුරාදින්ට සහ ජන්ම භූමියට කළගුණ සැලකීම සඳහා වැඩම කිරීම,

කිඹුල්වත් නුවරට වැඩමකොට සුද්ධෝදන රජුට දහම් දෙසීම. ධර්මපාල ජාතක කතාව දේශනා කිරීම හා රජතුමා සෝවාන් ඵලයට පත් වීම ,

යශෝදරා දේවිය උදෙසා චන්න කින්නර ජාතකය (සඳ කිඳුරු ජාතකය) දේශනා කිරීම,

රාහුල කුමාරයා සහ නන්ද කුමාරයා පැවිදි කරවීම,

දහම් අවබෝධ ලබාගත් අනෙකුත් කුමාරවරුන් අතර ආනන්ද,අනුරුද්ධ,දේවදත්ත සහ උපාලි යන තරුණ කුමාරවරු පැවිදි බිමට පත්වීම,

මහා ප්‍රජාපතී ගෝතමී දේවිය සෝවාන් ඵලයට පත්වීම,

සුද්ධෝදන රජුගේ ඉල්ලීම පරිදි දෙමාපිය අවසරය නොමැතිව ශාසනයට කුල දරුවන් පැවිදි කර නොගන්නා ලෙස බුදු රජාණන් වහන්සේ විනය නීතියක් ද පණවන ලද්දේ අදවන් මැදින් පොහෝ දිනයකදීය

# ථෙරවාදී භික්ෂු අධ්‍යාපනය



බෞද්ධ දර්ශනය අන්තර්ගත පාළි ත්‍රිපිටක ආරක්ෂා කරන ලද, ශ්‍රී ලාංකේය භික්ෂු පරපුර හැඳින්වෙන්නේ "ථේරවාදීන්" වශයෙනි. ධර්මය සහ විනය නිර්මළ ව ආරක්ෂා කිරීමට ථේරවාදීහීහු දැඩි ව සිටියහ. එනම්, මහාකාශ්‍යප මහරහතන් වහන්සේ ප්‍රථම සංගායනාවේ දී ගන්නා ලද තීරණයක් වන, බුදුරජාණන් වහන්සේ විසින් පනවන ලද සියලුම ශික්ෂාපද කිසිම වෙනසක් නොකර එලෙසින් ම ආරක්ෂා කළ යුතුය, යන්නයි. එම ප්‍රතිපත්තිය එසේම ලාංකේය ථෙරවාදී භික්ෂූන් විසින් ද පවත්වාගෙන එන ලදී.

ථේරවාදීන්ට 'විනය ධරයෝ'යැ'යි විරුදාවලියක් ද ඇත. එයට හේතුව, උන්වහන්සේලා විනය පිටකයට වැඩි අවධානයක් යොමු කරමින් විනය අධ්‍යයනය සඳහා ප්‍රමුඛත්වයක් දීමයි. විනයධරයන්ගේ මතය වන්නේ

**'පමුට්ඨම්පි ච සුත්තන්තේ අභිධම්මෙ ච තාවදෙ,**

**විනයෙ අවිනට්ඨම්හි පුන තිට්ඨති සාසනං'. ( මහා. 244 පිටුව)**

'සූත්‍ර පිටකයත්, අභිධර්ම පිටකයත් පිරිහී ගියත් විනය පිටකය නොනැසී පවතින තාක්කල් ශාසනය පවතින්නේය'. එනිසා ලාංකේය ථෙරවාදී මහතෙරවරුන් විසින් භික්ෂූන්ගේ විනය ගරුත්වයට විශේෂ අවධානයක් යොමු කරන ලදී. ඒ බව විනය පිටකයට අයත් පෙළ, අට්ඨකථා, ටීකා ග්‍රන්ථවලට අමතර ව , විනය සාහිත්‍යයක් ද ද ථෙරවාදීන් විසින් සංවර්ධනය කිරීමෙන් පැහැදිලි වන්නේය. එනිසා ම, ශ්‍රී ලාංකේය භික්ෂු පරපුර, පැවත එන්නේ විනයධර උපාලි මහරහතන් වහන්සේගෙන් බව සමන්තපාසාදිකාවේ දැක්වේ. එම ථෙරවාදී භික්ෂු පරපුර මෙසේය.

**උපාලි දාසකො චෙව සොණකො සිග්ගවො තථා**

**තිස්සො මොග්ගලිපුත්තො ච පඤ්චෙතෙ විජිතාවානො..........**

**තතො මහින්දො ඉට්ඨියො උත්තියො සම්බලොපි ච .....ජම්දීපා ඉධාගතා**

**විනයං තෙ වාචයිංසු පිටකං තම්බපණ්ණියා. ( සම. 35-36 පිටු)**

විනයධර උපාලි මහරහතන් වහන්සේ, දාසක මහරහතන් වහන්සේ,

සෝණක මහරහතන් වහන්සේ , සිග්ගව මහරහතන් වහන්සේ , මොග්ගලීපුත්ත තිස්ස මහරහතන් වහන්සේ, සහ දඹදිවින් වැඩම කළ මහාමහින්ද, ඉට්ඨිය, උත්තිය, සම්බල, භද්දසාල මහරහතන් වහන්සේලාගෙන් අරිට්ඨ ආදී ලාංකේය මහාසංඝ පරම්පරාව ආරම්භවේ. අරිට්ඨ මහරහතන් වහන්සේගෙන් පැවත එන සඟපරපුර පිළිබඳ විස්තර වංසක්ථාවලත්, නිකාය සංග්‍රහය, පූජාවලිය 34 පරිච්ඡේදය, රාජවලිය ආදී පොත්වලත් සඳහන් වේ. අවිච්ඡින්න ව පැවත එන ථෙරවාදී සංඝ පරම්පරා නිකාය සංග්‍රහයේ පැහැදිලිව දැක්වේ.

**උපාලි........මහින්ද....අරිට්ඨ....තිස්ස,චූල දේව,සිව...(නිකා.22-23පිටු)....දිඹුලාගල කාශ්‍යප..( නිකා. 50 පිටුව).....වනරතන... (නිකා. 52 පිටුව) ...අනවමදර්ශී...(නිකා. 62 පිටුව) පලාබද්ගල ධර්මකීර්ති......(නිකා. 62 පිටුව)...දෙවන ධර්මකීර්ති....( නිකා.66 පිටුව) .... ජයබාහු ධර්මකීර්ති....(නිකා. 72 පිටුව) ....වැලිවිට සරණංකර.... ( නිකා. 78 පිටුව)... අමගහපිටියේ ඥානවිමලතිස්ස.... (නිකා. 86 පිටුව)....අඹගහවත්තේ ඉන්දාසභවරඥාණ...**

අරිට්ඨ මහරහතන් වහන්සේ ප්‍රධාන ලාංකේය ථෙරවාදී භික්ෂූන් විසින් ත්‍රිපිටකයට අයත් සියලුම පෙළ පොත් වලට සීහලට්ඨකථා සකස් කරන ලද්දේ මිහිඳු මහරහතන් වහන්සේ වැඩ සිටි කාලයේ දීමය. ඒවා අතර මහට්ඨකථාව, මහාපච්ඡරියට්ඨකථාව, කුරින්දි අට්ඨකථාව, සංඛෙපට්ඨකථා, අරියට්ඨකථාව ආදිය ප්‍රධාන වෙයි. . ඒ හෙළ අටුවා දැන් භාවිතයට නැතත් එම එම හෙළ අටුවාවලින් ගත් උදෘත පාඨ, අට්ඨකථාවලත් ධම්පියා අටුවා ගැටපද සන්නය, ජාතක අටුවා ගැටපදය, විශුද්ධිමාර්ග සන්නය ආදී ගැටපද, සන්නවලත් ටීකාවලත් සඳහන් වේ.

ලබන කලාපයෙන් තවත් කොටසක්

මහාචාර්ය කොන්ගස්තැන්නේ ආනන්ද ස්ථිවරයන් වහන්සේ
ශ්‍රී සුමන පිරිවෙනමුද්දුව
රත්නපුර

# ධම්ම පදයෙන් බිඳක්

ප්‍රඥාවෙන් ලෝකය දකින්නට

අසාරේ සාරමතිනෝ

සාරෙ ච'සාරදස්සිනෝ


තෙ සාරං නාධිගච්ඡන්ති

මිච්ඡා සංකප්ප ගොචරා

**යම් කෙනෙක් වැදගත් නොවූ නිසරු අදහස් වල හරයක් ඇතැයි සිතත් ද, සාරවත් ධර්මයන් නිසරු කොට සලකත් ද, වැරදි අදහස් වලට ගොදුරු වූ ඔවුහු මාර්ග ඵලාදී සාරය නොලබත්**

# බොදු සමළු පුවත්

## සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ 102 වන සංවත්සරය











## බොදු සමඨ කටයුතු දැනුවත් කිරීමේ කොළඹ දිස්ත්‍රික් ප්‍රාදේශීය ශාසනාරක්ෂක බල මණ්ඩල රැස්වීම

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය මඟින් සිදුකරනු ලබන ජාතික ආගමික සහ ශාසනික කටයුතු පිළිබඳව කොළඹ දිස්ත්‍රික් ප්‍රාදේශීය ශාසනාරක්ෂක බල මණ්ඩල ගරු සභාපති සහ ලේඛකාධිකාරී ස්වාමින් වහන්සේලා දැනුවත් කිරිමේ විශේෂ රැස්වීමක් 2022.02.18 වන දින ප.ව. 2.30 ට බෞද්ධ මහා සම්මේලන මහාචාර්ය බී. ඇම්. ආරියපාල ශාලාවේ දී කොළඹ විශ්ව විද්‍යාලයේ කුලපති සහ කොළඹ දිස්ත්‍රික් ශාසනාරක්ෂක බල මණ්ඩලයේ ගරු සභාපති ආචාර්ය පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද නායක ස්වාමින් වහන්සේ ගේ ප්‍රධානත්වයෙන් සිදු කරන ලදි. මෙහිදි සම්මේලනය විසින් සිදු කරනු ලබන පහත කටයුතු පිළිබඳව දැනුවත් කිරිම සිදුවිය.

කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමෙන් පිහිටුවා ඇති ප්‍රාදේශීය ශාසනාරක්ෂක බල මණ්ඩල සහ සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය අතර නිරන්තර සබඳතාවයක් තුලින් සම්මේලනය විසින් දහම් පාසල් ගුරුවරුන් සඳහා නායකත්ව පුහුණු වැඩමුළු පැවැත්වීම සහ දහම් ගුරුවරුන් වෙනුවෙන් පිරිනමන ගෞරව ප්‍රණාම අධ්‍යාපන ශිෂ්‍යත්ව පිරිනැමීම බෞද්ධාලෝක මාවතේ වෙසක් පිළිබඳව සහ පුරාවිද්‍යා උරුම සුරක්ෂාව දැනුවත් කිරීම මුඛ්‍ය පරමාර්ථය විය.

ගරු සභාපති චන්ද්‍ර නිමල් වාකිෂ්ඨ මැතිතුමා විසින් මහාසංඝයා වහන්සේ පිළිගෙන රැස්වීමේ අරමුණ පැහැදිලි කිරීමෙන් පසුව ගරු නියෝජ්‍ය සභාපති රොෂාන් සම්පත් මද්දුමගේ මැතිතුමා විසින් සම්මේලනය මඟින් වාර්ෂිකව පවත්වන බෞද්ධාලෝක වෙසක් උත්සවය පිළිබඳවත් ගරු උපසභාපති මහාචාර්ය නිමල් ද සිල්වා මහතා පුරාවිද්‍යා උරුමයන් ආරක්ෂා කර ගැනීම පිළිබඳවත් ගරුතර මහා සංඝරත්නය දැනුවත් කරන ලදි. ඊට අමතරව දහම් පාසල් ගුරුවරුන් සඳහා නායකත්ව පුහුණු වැඩමුළු පැවැත්වීම උසස් අධ්‍යාපනය හදාරන විශ්ව විද්‍යාල සිසුන්ටත් පාසැල් සිසුන් සහ සාමණේර ස්වාමීන් වහන්සේලා වෙත ශිෂ්‍යත්ව පිරිනැමීම සහ දහම් ගුරුවරුන් සඳහා ගෞරව ප්‍රණාම පිරිනැමීම සූර්යය බලශක්ති ව්‍යාපෘති හඳුන්වාදීම සම්බන්ධයෙන් සම්මෙලනය විසින් ගෙන යන වැඩපිළිවෙල සම්බන්ධයෙන් දැනුවත් කිරීම සිදුවිය.













ගරු උපසභාපතිවරුන් වන වසන්ත ද සිල්වා, උපේෂ් පෙතියාගොඩ, උපුල් රූපසිංහ සහ ව්‍යාපෘති උපදේශක මහින්ද තෙන්නකෝන් යන මැතිතුමන්ලා දේශකයන් වශයෙන් සහභාගී විය. රැස්වීම අවසානයේදී නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේලා සහ සම්මේලනයේ ගරු සභාපතිතුමා ප්‍රමුඛ නිලධාරීන් අතර පැවති විවෘත සංවාදයක් පැවති අතර ඒ තුලින් වටිනා ලෙස අදහස් හුවමාරුවක් සිදුවිය. බෞද්ධ මහා සම්මේලනය, මහා සංඝරත්නය සම්බුද්ධ ශාසනයේ අභිවෘධියට ඇප කැප වී ක්‍රියා කිරීම කෘතවේදීව සිහිපත් කරමින් උන්වහන්සේලා සමඟ ඉදිරියේදී අවවාද අනුශාසනා ලබා ගනිමින් කටයුතු කිරීමට දිවයිනේ සියළුම වෙහෙර විහාර,දායක සභා සම්බන්ධීකරණය කර ගනිමින් කටයුතු කරන බව සමලේකම් ඉෂාන් එදිරිසූරිය මහතා සිය ස්තුති කතාවේදී ප්‍රකාශ කරන ලදී. මෙම රැස්වීම සම්මේලනයේ ජාතික තරුණ මණ්ඩලය, සාමාජික හා සමිති සංවර්ධනය පිළිබඳ ජාතික මණ්ඩලය,ජාතික හා බෞද්ධ කටයුතු පිළිබඳ ජාතික විමර්ශණ මණ්ඩලය,ශිෂ්‍යත්ව කමිටුව, බෞද්ධාලෝක වෙසක් කමිටුව සහ පුරාවිද්‍යා සුරක්ෂා කමිටුව යන අංශයන් විසින් සම්බන්ධීකරණය කරන ලදී..

## සිංහල භාෂා දිනය මහත් අභිමානයෙන් සැමරුණ වගයි

2022 මාර්තු මස 03 වන දිනට යෙදී තිබුණ "සිංහල භාෂා දිනය" නිමිත්තෙන් එදිනම ප.ව. 3.00 ට සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ මහාචාර්ය එම්. බී. ආරියපාල ශාලාවේදී ගරු සභාපති චන්ද්‍ර නිමල් වාකිෂ්ඨ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මහත් අභිමානයෙන් සැමරීමට ක්‍රියාකරන ලදි. සිංහල භාෂා විශාරද මහාචාර්ය පූජ්‍ය පාතේගම ඤාණිස්සර නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ සහ සිංහල භාෂාවේ විකාශය පිළිබඳව ප්‍රධාන දේශනය සිදු කළ අතර පූජ්‍ය මාලේවන ධම්මවිජය ස්වාමීන්ද්‍රයන් වහන්සේ ගීත ප්‍රබන්ධනයෙන් හා ගායනයෙන් සිංහල භාෂාවේ වටිනාකම මොනවට පැහැදිලි කරන ලදි. සම්මේලනයේ ගරු උපසභාපති සහ පුරාවිද්‍යා උරුම සුරක්ෂා කමිටුවේ ගරු සභාපති මහාචාර්ය නිමල් ද සිල්වා මැතිතුමා විසින් පුරාවිද්‍යා මූලාශ්‍ර අනුව සිංහල භාෂාව මූලික කරගෙන දියුණු සංස්කෘතියක් පැවති බව පෙන්වා දෙමින් සමාලෝචන දේශනය සිදු කරන ලදී.

මෙදින සිංහල භාෂා දිනය වෙනුවෙන් තේමා කොට ගත්තේ "බුදු දහම සහ සිංහලය දේශීය චින්තනයේ අනන්‍යතාවයයි" වන අතර වසර 2500 ක වර්ණවත් ඉතිහාසයක් ඇති සිංහල භාෂාව ගතික භාෂාවක් වශයෙන් මේ දක්වා පෝෂණය වී අද තිබෙන තත්ත්වයට පත්ව තිබීම ගැන සංවාදයට ලක් විය. සිංහලයන් සිංහල භාෂාව කතා කළද ජාත්‍යන්තර භාෂාවක් වශයෙන් ඉංග්‍රීසි කරපින්නාගෙන සිටීම නිසා සිංහල භාෂාවට අත් වී ඇති ශෝචනීය තත්ත්වය පිළිබඳවත් නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ පෙන්වා දුන්හ "සිංහල භාෂාවට ඇති වර්තමාන අභියෝග" ජයගෙන අනාගතය වෙනුවෙන් සංරක්ෂණය කිරීම සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ මූලික පරමාර්ථය වූ අතර ඒ සඳහා සාර්ථක මඟපෙන්වීමක් මෙදින සිදු කෙරිණි. සිංහල භාෂා දිනයේ සංවිධාන කටයුතු බෞද්ධ හිමිකම් කොමිෂන් සභා නිර්දේශ කිරීමේ ජාතික ක්‍රියාන්විතය- භාෂාව, සංස්කෘතිය හා ජාතික අනන්‍යතාවය කමිටුව

ජාතික තරුණ මණ්ඩලය, සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය, ජාතික හා බෞද්ධ කටයුතු පිළිබඳ ජාතික විමර්ශන මණ්ඩලය විසින් සිදු කරන ලද අතර සභාව මෙහෙය වීම ගරු සමලේකම් තුෂාර දිලුම් වාහලතන්ත්‍රි මහතා විසින් සිදු කළ අතර ජාතික හා බෞද්ධ කටයුතු පිළිබඳ ජාතික මණ්ඩලයේ ගරු සභාපති විශ්‍රාමික නියෝජ්‍ය පොලිස්පති ලලින්ද රණවීර මහතා විසින් ස්තුති කතාව සිදු කරන ලදී.





## සිංහල භාෂා දිනයේ විශේෂ අවස්ථා

















# බෞද්ධාලෝක වෙසක්
## ශ්‍රී බු.ව. 2566/2022
## කොළඹ බෞද්ධාලෝක මාවතේ දී
## මැයි 15, 16 සහ 17 දිනවලදී

"ආරෝග්‍යා පරමා ලාභා" යන තේමාව මුල්කොට ගනිමින් තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ උතුම් වූ තෙමඟුල සිහිපත් කොට ලෝවැසි සියළු බෞද්ධයන් වෙසක් පොහෝ දිනය සමරන මේ අවස්ථාවේ දී සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය 20 වැනි වතාවටත් අභිමානවත් අයුරින් බෞද්ධාලෝක වෙසක් උළෙල මෙවර සංවිධානය කරයි.

**මෙම උතුම් පිංකමේදී පසුගිය වසර වලදී මෙන්ම විශේෂ ක්‍රියාකාරකම් කිහිපයක් සිදුකරනු ලැබේ.**

- සර්වඥ ධාතූන් වහන්සේලා වන්දනාව
- සීල සමාදාන වැඩ සටහන
- වෙසක් තොරණ
- වෙසක් පහන් කූඩු ප්‍රදර්ශනය
- උදාන ගී (භක්ති ගී)
- දන්සැල්
- චිත්‍ර ප්‍රදර්ශනය
- ආලෝක පූජාව සහ දහම් වැකි ප්‍රදර්ශනය



සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය
අංක 380, බෞද්ධාලෝක මාවත, කොළඹ 7. දුර : 011 2691695 ෆැක්ස් : 011 2688 517 වෙබ් අඩවිය - www.acbc.lk